# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/36 - 2017 සැප්තැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/10/62/2012

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.05.13 දිනැති හා අංක 1862/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.04.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බුත්පිටිය, පස්ගම්මන, අංක 160/1 හි පදිංචි ආර්. පී. අශෝක රාජපක්ෂ මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 130හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන)

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### කොළඹ කාර්මික අධිකරණයේ දී ය

ආර්. පී. අශෝක රාජපක්ෂ,
අංක 160/1, පස්ගම්මන,
බුත්පිටිය.

*ඉල්ලුම්කරු*

*නඩු අංකය :* ඒ-3556

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව,
අංක 130,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත
කොළඹ 02.

*වගඋත්තරකරු*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි

### තීන්දුව හා ප්‍රදානය

ඉහත අංක දරන නඩුවේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ අංක IR/10/62/2012 සහ 2014.04.11 දිනැති ලිපිය මගින් එකී ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා හට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කර ඇත.

2. එකී ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්ගේ අංක IR/10/62/2012 හා 2014.03.19 දිනැති ලිපිය මගින් ඉහත කී කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ ආර්. පී. අශෝක රාජපක්ෂ මහතා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුයුක්ත කිරීමේදී ඔහුගේ සේවාකාලය මත ලබා ඇති උසස් වීම්වලට අදාල අනුරූපී වැටුප හා වැටුප් වර්ධක ලබා නොදීමත් තනතුරු නාමය ලබා නොදීමත් නිසා අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ යනුවෙන් දක්වා ඇත.

3. මෙම ආරාවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් පළමු ප්‍රකාශ හා දෙවන ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරණය විසින් උත්සහ කළද එය අසාර්ථක වීම නිසා නඩුව විභාගයට ගන්නා ලදී.

1 A – G 26324— 14 (2017/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වයට නඩුව ආරම්භ කරන ලෙසට බේරුම්කරණය විසින් නියෝග කරන ලදින් ඉල්ලුම්කරුගේ සාක්ෂි ලබා දෙමින් නඩු විභාගයේ දී ඒ 1 සිට ඒ 8 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. පසුව වගඋත්තරකරුට නඩුව ආරම්භ කිරීමට බේරුම්කරණය විසින් නියෝග කරන ලදින් වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පරිපාලන නිලධාරී රාජපක්ෂ සුබසිංහ පතිරණගේ ජයදස යන අය පමණක් සාක්ෂි දෙමින් නඩු විභාගයේදී ආර් 1 සිට ආර් 5 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

6. මේ අනුව මෙම බේරුම්කරණය විසින් තීරණය කළ යුතුව ඇත්තේ යොමුවේ දැක්වෙන පරිදි ඉල්ලුම්කාර ආර්. පී. අශෝක රාජපක්ෂ මහතා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුයුක්ත කිරීමේදී ඔහුගේ සේවා කාලය මත ලබා ඇති උසස්වීම්වලට අදළ අනුරූපී වැටුප සහ වැටුප වර්ධක ලබා නොදීමත් තනතුරු නාමය ලබා නොදීමත් නිසා අසාධාරණයක් සිදුව ඇත්ද යන්න හා එසේ සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න ය.

7. ඉදිරිපත් වූ සමස්ත වාචික සාක්ෂි ලකුණු කළ ලේඛනත් දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ ලිඛිත දේශනත් පිළිබඳව සලකා බැලීමේදී ඉහත පරිදි මෙම නඩුවේ ඉල්ලුම්කාර ආර්. පී. අශෝක රාජපක්ෂ මහතාට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුයුක්ත කිරීමේදී ඔහුට කිසිදු අසාධාරණයක් සිදුවී නොමැති බවට මෙම බේරුම්කරණය තීරණය කරන බැවින් කිසිදු ප්‍රදානයක් ලබා නොදීමට තීරණය කරමි.

8. මා එසේ තීරණය කිරීමට හේතු නම්,

1. ජාතික නිවාස අධිකාරිය යටතේ පැවති ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ඒකාබද්ධ කිරීමට තීරණය කර ඇත්තේ 2011.01.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ය. ඒ බවට වගඋත්තරකාර සංස්ථාව විසින් ආර් 2 වශයෙන් අදළ ලේඛනය ලකුණු කර ඇත. ආර් 2 අනුව මෙම ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සියලු සේවකයින් 2011.02.01 දින සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුයුක්ත කර ඇත. එසේම එම අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේ දී මිට අදළ සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය ලබා ඇති බව එම වගඋත්තරකාර පාර්ශ්වයේ 2017.02.09 දින දරන තම ලිඛිත සැලකිරීම් මගින් දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැටුප තීරණය කර ඇත්තේ එම අන්තර්ග්‍රාහක ක්‍රියාවලියේ දී ය. ඉන්පසුව ඔහුගේ වැටුප සංශෝධනය කර ඇත. (ඒ. 7) ඒ අනුව වැටුප් ගෙවා ඇති බව ඉල්ලුම්කරු 2015.03.26 දින සාක්ෂියේ දී පිළිගෙන ඇත. (සාක්ෂි සටහන් 2015.03.26 පිටුව 76)
2. ජාතික සේවක සංගමය එදිරිව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (SC Appeal No. 15/2013) නඩු තීන්දුවේ දක්වා ඇති පරිදි කැබිනට් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණ අධිකරණ විමසුමට ලක්කළ නොහැකි බැවින් එකී තීන්දුව අනුගමනය කිරීමට මෙම බේරුම්කරණය ද බැඳී සිටිම.
3. මෙම නඩුවේදී ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි වගඋත්තරකාර පාර්ශ්වය විසින් දැඩි අභියෝගයට ලක්කර තිබීම.
4. මෙම නඩුවේ ඉල්ලුම්කරු විසින් හරස් ප්‍රශ්නවලදී තනතුරු නාමය වෙනස් වීම පිළිබඳව කිසිදු ඉල්ලීමක් නොකරන බව ප්‍රකාශ කර තිබීම.
(සාක්ෂි සටහන් 2015.03.26 පිටුව 85)
5. ඉල්ලුම්කරු අවබෝධයකින් තොරව සාක්ෂි ලබාදෙන බවට ඉල්ලුම්කරු විසින්ම පිළිගෙන තිබීම (සාක්ෂි සටහන් 2015.03.26 පිටුව 10)

9. මෙය සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් කොට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2017ක් වූ ජූනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-368